C
373

# ශ්‍රී ලංකාවේ මිශ්‍ර පාසල් සිසුන් පාසල් විෂයයන් කෙරෙහි දක්වන කැමැත්ත පිළිබඳ විමර්ශණයක්

# SUBJECT PREFERENCE AMONG STUDENTS IN CO-EDUCATIONAL SCHOOLS IN SRI LANKA

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ (අධ්‍යාපන පීඨයේ)
අධ්‍යාපන ශාස්ත්‍රපති, උපාධිය සම්බන්ධ අවශ්‍යතා
අර්ධ වශයෙන් පූර්ණය කිරීම සඳහා ඉදිරිපත්
කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි

පි.ඩී.ජේ.ගුණසේකර
ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන) පේරාදෙණිය වි.වි.

422297

**සා රා ං ශ ය**

මුල් යුගවලට වඩා අධ්‍යාපන ක්ෂේත්‍රය, විසිවන සියවසේ මෑත කාලයේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පර්යේෂණ කිරීමෙහි ලා අධ්‍යාපන මනෝ විද්‍යාඥයෝ බෙහෙවින් උනන්දු වූහ. වින්දන ක්ෂේත්‍රය කෙරෙහි නැඹුරු වූ මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ මිශ්‍ර පාසල්වල අ.පො.ස.(සා.පෙළ) සිසුන් (පිරිමි/ගැහැණු) 544 ක ගේ පාසල් විෂයයන් කෙරෙහි ඇති සාපේක්ෂ විෂය කැමැත්ත විමසීම සඳහා කරන ලද්දකි.

වින්දන ක්ෂේත්‍රයට අයත්වන විෂය කැමැත්ත සම්බන්ධව මෑත අඩසියවස තුළ කරන ලද අධ්‍යයන විමසමින් විෂය ජනප්‍රිය තාවයත්, විෂය කැමැත්ත හා ලිංගික බව අනුව විෂය කැමැත්තේ වෙනස්කම් හඳුනා ගැනීමත් විවිධ පාසල් විෂයයන් සම්බන්ධව කරනලද අධ්‍යයනයන් ගැනත් මුලින් විග්‍රහ කරන ලදි. ඊළඟට කල්පිත අටක් යටතේ මෙම අධ්‍යයනය මෙහෙයවන ලදි. පුද්ගල වෙනස්කම් අනුව විෂය කැමැත්තේ වෙනස්වීම ද, පිරිමි හා ගැහැණු වශයෙන් සිසුන් අතර ඇති විෂය කැමැත්තේ වෙනස්කම් ද, මිශ්‍ර පාසල්වල පිරිමි හා ගැහැණු සිසුන් අතර ඇති විෂය කැමැත්ත ලිංග අනුව වෙනස්වීම ද, පාසල් විෂයයන්ගෙන් කැමැත්ත අනුව තෝරා ගැනීමට ඇති වෛකල්පික විෂයට අදාළව විවිධ විෂයයන් තෝරාගැනීම පිරිමි හා ගැහැණු බව අනුව සිදුවීම ද, ගුරුවරුන්ට ඇති කැමැත්ත, පාසලට ඇති කැමැත්ත, හා විෂය සාධනය යන විචල්‍ය හා විෂය කැමැත්ත අතර ඇති සම්බන්ධතාවය ද විමසන ලදි. තවද ශ්‍රී ලංකාවේ හා බ්‍රිතාන්‍යයේ විෂය කැමැත්ත දත්තයන් අතර වෙනස්කම් විමසන ලදි.

සොයාගැනීම් අනුව සිසුන් තුළ විෂය කැමැත්ත සම්බන්ධව විවිධ කැමැතිකම් හා කැමැත්තෙහි විවිධ වෛස්තර එළිදරව් විය. තනිලිංගික පාසල්වලට වඩා විෂය කැමැත්ත සම්බන්ධව වෙනස් කැමැතිකම් මිශ්‍ර පාසල්වල සිසුන් තුළ විද්‍යමාන විය. විෂය කැමැත්ත හා ගුරුවරුන්ට ඇති කැමැත්ත අතර ඇති තරා සහසම්බන්ධතාවය දුරස්ථය. විෂය කැමැත්ත හා සාධනය අතර ඇත්තේ ද එබඳු තත්වයකි. විෂය කැමැත්ත හා පාසලට කැමැත්ත අතර වෙසෙසි සහසම්බන්ධතාවයක් ඇත. ශ්‍රී ලංකාව හා බ්‍රිතාන්‍ය අතර විෂය කැමැත්ත සම්බන්ධ දත්තවල අසමානකම් ඇත. වැඩි සාධනයක් ඇති විෂයයන් හා ලිංගානුබද්ධව කැමැත්ත විහිදෙන විෂයයන් අතර යම් සමානකමක් ඇත. විෂය කැමැත්ත සම්බන්ධව මිශ්‍ර පාසල්වල හා තනිලිංගික පාසල්වල ද-

දක්නට ලැබෙන අසමාන කම් සමහර විෂයයන් සම්බන්ධයෙන් පමණක් ඇත. නමුත් කැමැත්තේ ප්‍රමාණවල විවිධතා ඇත.

ඇතැම් විෂයයන්ට කැමැත්ත වැඩි බවත්, සාධනය ඉතාම අඩුවීම සම්බන්ධවත්, දෙවන භාෂාවට අකමැති වීම සම්බන්ධවත්, ගණිතය විද්‍යාව වැනි විෂයයන් හී සාධනය අඩුවීම සම්බන්ධවත්, හේතු සාධක සෙවීමට හා පිළියම් යෙදීමේ පර්යේෂණ කිරීම අත්‍යවශ්‍ය බව හැඟේ.

oooooooooo